**25 පිටෙන්**

"ඒ වුනාට තවම තියරියේ පොඩි අවුල් ටිකක් තියෙනවලු නේද?"

අණ්ඩරයා අබරන්ට නොපෙනෙන්නට ඉඟියක් කළ නිසා සිදුවී ඇති දේ හිතා ගැනීම කිසිවකුට අමාරු වුනේ නැත. මෙවැනි අණ්ඩර ලස්සනට ඇඹරීම අණ්ඩරයාගේ විශේෂ දක්ෂතාවකි. අණ්ඩරයාගේ පේටන්ට් කළ හැකි අදහස අබරන් දැන් පොර වාගේ හතර අතට දෙන්නේ ඇත්තටම ඇණගෙනය.

"සිරානේ මචං. දැන් ඔය වැඩෙන් අපිට අහක ඉඳලා කරන්ට් වදින එකක් නැද්ද?" මමත් පැත්තක සිට අබරන්ව ෆෝම් කළෙමි.

"එහෙම වෙන්නේ නැහැල්ලූ. කරන්ට් එක යවන්නේ ඉලෙක්ට්‍රෝ මැග්නටික් වේව්ස් විදිහටලූ."

අබරන් ගිරවා වගේ දෙන්නේ අණ්ඩරයාගේ වචන බව කාට වුණත් පැහැදිලිය. අණ්ඩරයාගේ මෙවැනි ගොන්පාට් ඒ දිනවල අපේ එදිනෙදා ජීවිතයේ කොටසකි.

ඒ දවස්වල ගොන්පාට් එකක් වූ මේ කතාව ගොන්පාට් එකක්ම නොවේ. තවමත් පර්යේෂණ මට්ටමේ වුවත් මෙවැනි තාක්ෂණයක් තවදුරටත් සිහිනයක් නොවන අතර ඉදිරියේදී "වයර්ලස්" ලෙස විදුලිබල්බයක් දැල්වීම සිහිනයක් නොවිය හැකිය.

රැහැන් රහිතව විදුලිය සම්ප්‍රේෂණය කරන අයුරු සොයා නොගත්තත් මහාචාර්ය මහාලිංගම් ඒ කාලයේ අපේ වීරයෙක් මෙන්ම අතීත මතකයේද කොටසකි. ඔහු පාවිච්චි කළ මෝටර් රථය එවකට භාවිතයේ පැවති මාදිලියක නවීන මෝටර් රථයක් නොවූවත් හැමවිටම ඉතා හොඳ තත්ත්වයෙන් නඩත්තු කර තිබුණේය. එමෙන්ම, ශාරීරික ව්‍යායාම සඳහා දිනපතාම සරසවිය හරහා සැලකිය යුතු දුරක් ඇවිදීම මහාචාර්ය මහාලිංගම් නොවරදවා කළ දෙයකි. මහාලිංගම් මහත්මියද මේ කටයුත්තට බොහෝ විට එක්විය. මහාචාර්ය මහාලිංගම් උපන් දිනය මා හරියටම නොදන්නා නමුත් ඔහු විසින් විඳ ඇතැයි මා සිතන දීර්ඝායුෂ ඔහුගේ මෙවැනි යහපත් ජීවන විලසිතාවන්හි ප්‍රතිඵලයක් මිස අහම්බයක් නොවේ.

මැලේසියානු ලාංකිකයෙකු වූ තරුණ මහාලිංගම් 1946දී ලංකාවට පැමිණෙන්නේ ලංකා තාක්ෂණික විද්‍යාලයෙහි උපාධි අධ්‍යාපනය ලබා ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යා බාහිර උපාධියක් ලබාගැනීම සඳහාය. මේ කාලයේදී වත්මන් සිංගප්පූරුවද ඇතුළත් නිදහස ලබා නොතිබුණු මැලේසියාව තුල සරසවි අධ්‍යාපනය ලබාදෙන ආයතන කිසිවක් තිබුණේ නැත.

මේ කාලයේදී යමක් කමක් තිබුණු මැලේසියානුවන්ගේ සිහිනයක් වූයේ සිය දරුවන් එංගලන්තයට හෝ ලංකාවට එවා උසස් අධ්‍යාපනය ලබා දීමයි. විශේෂයෙන්ම එවකට මැලේසියාවේ රජයේ ඉහළ තනතුරු බොහොමයක් දැරූ උගත් ලාංකිකයෝ සිය දරුවන් ලංකාවට එවා උසස් අධ්‍යාපනය ලබාදුන්හ. ලංකාවේ නීති විද්‍යාලය, වෛද්‍ය විද්‍යාලය, යුනිවර්සිටි කොලීජිය මෙන්ම තාක්ෂනික විද්‍යාලයද කලක සිට කලාපයේ නමක් දිනාගෙන සිටි අධ්‍යාපන ආයතනයි. වෛද්‍ය විද්‍යාලය සහ යුනිවර්සිටි කොලීජිය 1942දී ලංකා විශ්ව විද්‍යාලය තුලට අවශෝෂණය වී තිබුණත් ඉංජිනේරු පීඨය ඇරඹුණේ වසර ගණනක් පමාවී 1950 වසරේදීය.

අධ්‍යාපනය සඳහා ලංකාවට පැමිණි මැලේසියානුවන් බොහෝ දෙනෙකු ආපසු සිය ගම්බිම් බලා පිටත් වූ නමුත්, එවකට සේවය කිරීමට හා වාසයට ඉතා යෝග්‍ය තැනක් වූ ලංකාවේ දිගටම රැඳෙන්නට මහාලිංගම් තරුණයා තීරණය කළේය. 1950 වසරේදී ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය පිහිටවන විට එහි ආරම්භක කථිකාචාර්යවරයෙක් ලෙස මහාලිංගම් සේවයට බැඳුණේය. පසුව ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය පේරා-දෙණිය විශ්ව විද්‍යාලයයේ ඉංජිනේරු පීඨය බවට පත් වූ අතර එංගලන්තයේ ෂෙෆීල්ඩ් විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය (PhD ) ලබා ආපසු පැමිණි ආචාර්ය මහාලිංගම් පසුව ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ්ීජ ගෞරව ආචාර්ය උපාධියක්ද ලබා මහාචාර්යවරයෙකු ලෙස දිගටම සේවය කළේය.

1940 වසරේ නොවැම්බර් 07 දින ඇමරිකාවේ වොෂින්ටන් ප්‍රාන්තයේ ටකෝමාහි ඉදිකර තිබුණු එවකට ලෝකයේ තිබූ තෙවන දිගම එල්ලෙන පාලම, එය විවෘත කර මාස හතරකට පසුව පැයට සැතපුම් 42ක සුළඟකට ඔරොත්තු දිය නොහැකිව බිඳ වැටුණේ ඉංජිනේරුවන් මවිතයට පත් කරවමිනි. මේ පාලම සැලසුම් කර තිබුණේ පැයට සැතපුම් 120ක සුළඟකට වුවද ඔරොත්තු දිය හැකි පරිදිය. පසුව සොයාගැනුනේ පාලම බිඳවැටීමට හේතුව අනුනාදය (resonance) බවයි. මේ සිදුවීම අලලා සකස් කෙරුණු වාර්තා චිත්‍රපටයක් පේරාදෙණිය ඉංජිනේරු පීඨයේදී නිතර ප්‍රදර්ශනය කෙරුණේය. මෙය මහාචාර්ය මහාලිංගම්ගේ විෂය ක්ෂේත්‍රය විය.

ටකෝමා පාලම බිඳවැටීමේ 75වන සංවත්සරයට දින හතරක් ඉතිරිව තිබියදී, මහාචාර්ය මහාලිංගම් යාපනයේ රෝහලකදී සිය දිවිසැරිය නිමකළේය.

http://economatta.blogspot.com.au/

## සංගීත් නිපුන් සනත් නන්දසිරි "සීත රෑ වසන්තේ" සමගින්









